# ගැබ්ගෙළ පිළිකාව පිළිබඳව ඔබ දැනුවත් වීම ඉතා වැදගත්

## සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය විසින් ගැබ්ගෙළ පිළිකාව ජාතික වශයෙන් වැළැක්වීමේ ක්‍රියාදාමයට විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ ගැබ්ගෙළ පිළිකා වැළැක්වීමේ අරමුණෙන්, සුවනාරි සායන මඟින් පැප් පරීක්ෂාව සිදුකරනු ලැබේ. එමඟින් ගැබ්ගෙළ පිළිකාවේ මූලික අවස්ථා හඳුනාගෙන රෝගීන් ප්‍රතිකාර සඳහා යොමු කෙරේ. එනමුත් ලංකාවේ උග්‍ර පිළිකා තත්ත්වයන්ට වර්ධනය වූ රෝගීන් 850 - 1000 අතර ප්‍රමාණයක් අළුතින් හඳුනාගනු ලැබේ.

ගැබ්ගෙළ පිළිකා වැළැක්වීමට මෙපමණ කල් රටතුළ පවත්වාගෙන යන කලින් හඳුනාගැනීමේ පරීක්ෂණ තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය සෞඛ්‍ය අමාත්‍යංශය විසින් හඳුනාගෙන ඇත. මීට අමතරව, පරීක්ෂණ මඟින් හඳුනාගන්නා මූලික පිළිකා තත්ත්වයන්ට ගොදුරු වූ සියළුම රෝගීන් නියමිත ප්‍රතිකාර සඳහා යොමු කිරීමත් ඔවුන්ට නිසි ප්‍රතිකාර ලබාදීමත් ප්‍රධාන අරමුණු ලෙස සලකනු ලැබේ. ගැබ්ගෙළ පිළිකාව සඳහා ප්‍රධාන වශයෙන් හේතුකාරක වනුයේ වෛරසයක් බැවින් ඒ සඳහා ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන තුළින් එන්නතක් හඳුන්වාදීමට ද බලාපොරොත්තු වේ.

යහපත් සෞඛ්‍ය පුරුදු සඳහා ජනමාධ්‍ය දායකත්වය ඉතා වැදගත් වන අවධියක ගැබ්ගෙළ පිළිකා රෝගය වැළැක්වීම සඳහා ''සුවය'' සඟරාව ලබාදෙන දායකත්වය ප්‍රශංසනීය වේ.

ගැබ්ගෙළ පිළිකාව හඳුනාගැනීම, ප්‍රතිකාර කිරීම හා එන්නත්කරණය මඟින් වළක්වාගැනීම පිළිබඳ විමර්ශනාත්මක ලිපි ගණනාවක් පෙළ ගැසී ඇති මෙම සඟරාවෙන් ඔබට ඉතා වටිනා තොරතුරු රැසක් ලබාගත හැකිවේ. එම තොරතුරු අවබෝධයෙන් යුතුව පිළිපැදීමෙන් තම ජීවිතය හා සමාජය ගැබ්ගෙළ පිළිකා අවධානමෙන් මුදවාගෙන ප්‍රීතිමත් හා සුවබර දිවියක් ගතකිරීමේ භාග්‍යය උදාකරගත හැකි බව මාගේ විශ්වාසයයි.

**විශේෂඥ වෛද්‍ය**
**පාලිත මහීපාල**
**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්**
**සෞඛ්‍ය පෝෂණ හා දේශීය**
**වෛද්‍ය අමාත්‍යංශය**